INTRODUCING 1st TIME IN UK

FareDeals Travel & Tours
Fly With Someone You Trust
FareDeals Travel & Tours Ltd.
458, Alexandra Avenue, Rayner's Lane,
(Opp:Tube). HA2 9TL. United Kingdom.

- All Deals Available in Colombo Market (in Rupees)
- Cheaper than Leading Agents in Colombo
- We deliver Tickets to your Door Step in Sri Lanka
- No Middlemen, Book Directly with us in London

Fly to Colombo

Srilankan Air	£ 315*
Qatar Air	£ 295*
Kuwait Air	£ 200*
Oman Air	£ 160*
Ethihad Air	£ 350*

Buy your COLOMBO to LONDON/ UK, Australia, Italy, USA, Tickets. pay in pounds or rupees.

Fly to London / UK

Srilankan	Rs. 85000*
Qatar	Rs. 62000*
Kuwait	Rs. 56000*
Royal Jor	Rs. 58000*

Student Offers (o/way)

Srilankan	Rs. 50000*
Qatar	Rs. 58000*
Kuwait	Rs. 41200*

* Fares subject to taxes/change

Contact - Dulip, Nimesha, Sunirma or Fernando.
Emergency Travel ctc Dulip
0208 150 9183 07551549554
Call us free. 0800 612 4045 info@faredealtravels.co.uk
ETIHAD Emirates CATHAY PACIFIC KUWAIT AIRWAYS SriLankan QATAR AIRWAYS

CHRISTMAS SEASON LOWEST PRICES TO COLOMBO

වර්ල්ඩ් එයාර් ට්‍රැවල්ස්

SriLankan Airlines - fr 355 +Taxes
Qatar Airways - fr 351 +Taxes
Kuwait Airways - fr 210 +Taxes

*All Fares are low season and subject to availability

01737 215298 / 01737 215298
07865081261

e-mail : dilhan@worldairtravels.co.uk
Web : www.worldairtravels.co.uk

ලංකා රෝහල්වල සේලයින් බෝතල් ඇතුළේ වීදුරු කටු සහ ප්ලාස්ටික් කැලි

ශ්‍රී ලංකාවට බාල ඖෂධ වර්ග ඉවක් බවක් නැතිව විවිධ සමාගම් සහ පුද්ගලයින් ගෙන් වන බවත් ඒ ගැන සෞඛ්‍ය බලධාරීන් හෝ සෞඛ්‍ය ඇමතිවරයා කිසිදු පියවරක් ගෙන නැති බවත් ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුරකුමාර දිසානායක මහතා නොබෝදා ශ්‍රීලංකා පාර්ලිමේන්තුවට පැවසීය. ඔහුගේ කතාවේ අඩංගු වූ දෑ මෙසේය.

සමහර ඖෂධ සහ එන්නත් වෛද්‍ය උපකරණ කල්පැනගිය ඒවා නමුත් තවමත් ඒවා රෝගීන් සඳහා පාවිච්චිකරන බැව් පෙනී ගොස් ඇත. මේ පසුගිය සැප්තැම්බර් මාසයේ රජයේ රෝහල් වලින් නිකුත් කළ ඕමප්‍රෙසෝල් Omeprazole නම් ඖෂධයේ තිබී ගුල්ලෙකු හමුවී ඇත. පසුගිය මස ඔක්තෝබර් රත්නපුර හා ඇඹිලිපිය රෝහල් වල සිපියුරොක්සින් Cefurozine ඩෙසමෙත සෝන් Dezamethesone සහ හයිඩ්‍රෝ කෝට සීන් Hydrocortisine යන ඖෂධ ඇතුළත් එන්නත් කුප්පිවල තිබී වීදුරුකටු සොයා ගන්නා ලදී. ඇඹිලිපිටිය රෝහලේ සේලයින් බෝතලයක කුණු රොඩු සහ ප්ලාස්ටික් කැබලි තිබී හමුවිය. අනුරාධපුරය හා හම්බන්තොට රෝහල් වල සර්ප විෂට විදින බෙහෙත්වල කළු පැහැති ගුලි වගයක් හමුවී ඇත. මීට අමතරව එන්නත් ලබා දෙන වෛද්‍ය උපකරණයන්හි කෙස්ගස් සොයා ගෙන තිබේ. තවද සේලයින් බෝතල වල තිබී ඇලුමිනියම් කැලි ලැබී ඇත. රජයේ රෝහල් වල දැනට දෙන පැරසිටිමෝල් හා ඇස්ප්‍රින් පරණ වූ පාවිච්චියට නුසුදුසු එවා යි වෛද්‍ය සංගම් පවසා තිබිණ. මේ දැනට වාර්තා වී ඇති කීපයක් පමණි වාර්තා නොවූ දේ සිය ගණනින් ඇත. අද ශ්‍රීලංකා වේ ඖෂධ ගෙන්වීම සහ බෙදා හැරීම වෛද්‍ය විද්‍යාව ගැන කිසිදු දැනීමක් නැතී මක් නැති විවිධ පුද්ගලයින්ගේ ලාභ ලබන විශාල ජාවාරමක් බවට පත්ව තිබේ. ජනතා වගේ ජීවිත අනතුරේ හෙලන මෙවැනි කුට අපරාධ ගැන සොයා බලන්නට හෝ නිසි පියවරක් ගන්නට රජය හා සෞඛ්‍ය ඇමති වරයා අපොහොසත්ව ඇති බව පෙනේ.

♦ *කේ. එල්. කරුණාරත්න* Sri Lanka

♥ පැටියො ඩාලිං

" පැටියො දන්නවයි වැඩක්.... අන්න මැක් ඩොනල්ඩ්කාරයා පුදුම අළුත් හැම්බර්ගර් ජාති යක් හදලලු .....ඒ එකක් කෑවම මාස තුනක් යනකල් බඩගිනි දැනෙන්නෙ නැතිලු.... "

" හැබෑට....? එහෙනම් දැන් බය නැතුව අවුරුද්දක් වුනත් එක දිගට මාරාන්තික උපවාස කරන්න ඇහැකි නේද? .... "

" නැතුව..... නැතුව....."

Sinhala Lesson 03 සිංහළ පාඩම

සිංහල ඉගෙනීමට පහසු මගක් !

These Sinhala lessons are especially designed for the Sinhala expatriate children to learn Sinhala language correctly - also for foreigners who are keen to learn this beautiful language.

The sound of each Sinhala letter corresponds to the underlined part of the English word. Now read aloud the Sinhala letter.

Vowel Strokes

ා ැ ෑ ි ී ු ූ ෘ ෙ ේ ො ෝ ෞ

ග gun ගා garden ගැ gander
ගෑ gas ගි begin ගී geese
ගු good ගූ goose ගෙ get
ගේ gatee ගො got ගෝ go
ග් rug

♦ ආචාර්ය සුභද්‍රා සිරිවර්ධන
Dr Subhadra Siriwardane - MA PhD London

හරස්පද ප්‍රහේලිකා 113



හරහට :
1 කෙළවර 3 දම්වැල
5 ර.යෙන් දවාලෙන් අහසෙ පෙනෙ
6 ගතිගුණ අතින් සමහරු මූ වැනිය
7 තොවිලයට අවශ්‍යය
8 පවුල 9 හොරුන්ට නැත

පහළට :
1 අයහපත්
2 වැඳුම් ලබන සතෙක්
3 කාරුණික
4 පෝරුවට නගින්නී 8 ඉහළ යන අයට අමතක වේ

ගියවර නිවැරදි විසඳුම්
හරහට : 1 ලිපිකරුවා 5 හිරු 6 අනන්තය 8 කාල 9 ලඳ 10 පඩු
පහළට : 2 පිහින 3 කරුන්කා 4 වාඩිය 6 අපල 7 තලප

නේක රසෙන් පිරිපුන් සිංහල ඉවුම් පිහුම්

නත්තල් කේක් CHRISTMAS CAKE

අවශ්‍ය ද්‍රව්‍ය : වියලි මිදි වර්ග තුනක් එනම්,
Seedless raisins, currants and sultana
ග්‍රෑම්ස් **225** බැගින් ගන්න.
දොඩම් ලෙමන් නාරං ආදියේ ලෙලි
එක්කර සාදා ඇති මිශ්‍ර පීල් ග්‍රෑම් **100**
අඹරාගත් ආමන්ඩ් ග්‍රෑම් **50**
(Crystallized) චෙරි ග්‍රෑම් **50**
ලෙමන් ගෙඩියක රහැගත් පොත්ත
බටර් ග්‍රෑම් **225** සීනි ග්‍රෑම් **175**
බිත්තර **4** යි පිපෙන සාමාන්‍ය පිටි ග්‍රෑම්**225**
කුරුඳුකුඩු සාදික්කා ස්වල්පයක්
දෙහි යුෂ මේස හැඳි **2** ක්
බ්‍රැන්ඩි මේස හැඳි **4** ක්

සාදන ක්‍රමය : මිදි වර්ග, ආමන්ඩ්, චෙරි, ලෙමන් පොතු යනාදිය එකට මිශ්‍රකරන්න. එය පසෙක තබන්න.

සීනි සහ බටර්, ක්‍රීම් එකක් වනතුරු හොඳින් මිශ්‍රකරන්න. එය ද පසෙක තබන්න. බිත්තර වරකට එක බැගින් ගසාගන්න. එයට පිටි මේස හැන්ද බැගින්ද එක්කර මින් කළවම් කරගන්න.

ඉතුරු පිටි, ලුණු, කුරුඳු, සාදික්කා, කරදමුංගු ආදී සියල්ල ද, බිත්තර මිශ්‍රණයද, ක්‍රීම් භාජනයට දමා හොඳින් කළවම්කරන්න. එයට වියළි පළතුරු මිශ්‍රණයද, බ්‍රැන්ඩිද එක්කරන්න. හොඳින් සියල්ල එකට මිශ්‍රකරන්න. දැන් මේ මිශ්‍රණය ග්‍රීස් කොළයක් ඇතිරූ අඟල් **8 x 7** රවුම් හෝ හතරැස් කේක් ටින් එකකට පුරවන්න. මට්ටම් කරන්න. එහි හරි මැද කුඩා හිලක් හදන්න.

ටින් එක වටා ඝනකමට පත්තර පිටු කීපයක් පටි මෙන් නවා ඔතන්න. ඒ කේක් කරවෙනු වළක්වනු පිණිසය. දැන් එය කලින් රත්කරගත් උදුනක තබා පැය **3½** ක් පමණ කල් පුළුස්සාගන්න. කේක් එක මැදට කම්බි කූරක් ඔබා ඇතුළත හරිහැටි පිළිස්සී ඇත්දැයි විමසන්න. ටින් එක තුළම නිවෙන්නට හරින්න.

♦ *චිත්‍රා රමණි ගමගේ* London NW2

Sam's CHICKEN CHICKEN CHICKEN
Great Tasting! Great Value!
සෑම්ස් විකන්
17 HIGH STREET, WEALDSTONE, HARROW HA3 5BY, TEL: 020 8861 1872
439 HIGH ROAD, WILESDEN, LONDON NW10 2JJ, TEL: 020 8451 7662
84 HIGH STREET, HARLESDEN, LONDON NW10 42J, TEL: 020 8838 2036
246 KINGSBURY ROAD, KINGSBURY, LONDON NW9 9HN, TEL: 020 8204 1432